**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**
**සම්බන්ධීකරණ නිලධාරීන් බඳවාගැනීම**

විදේශ රැකියාවන් හි නියුක්තව සියරට පැමිණෙන්නන් නැවත සමාජයට ඒකාබද්ධ කිරීමේ යාන්ත්‍රණය වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් බදුල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරනු ලබන නියමු ව්‍යාපෘතියක් සඳහා සම්බන්ධීකරණ නිලධාරීන් බඳවාගැනීමට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් සපුරා තිබිය යුතු බඳවා ගැනීමේ සුදුසුකම් හා කොන්දේසි :

I. අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

II. 2018.11.30 දිනට වයස අවුරුදු 59 නොඉක්මවිය යුතුය.

III. මෙම නියමු ව්‍යාපෘතියට වසරක කොන්ත්‍රාත් කාලසීමාවක් සඳහා නිලධාරීන් බඳවාගනු ලබන අතර, බදුල්ල දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන්හට ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දෙනු ලැබේ.

IV. මෙම නියමු ව්‍යාපෘතියේ සේවය සඳහා බඳවා ගන්නා පුද්ගලයින් ක්ෂේත්‍ර රාජකාරී කටයුතු වල නිරත විය යුතු බැවින් පිරිමි අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛත්වයක් ලබා දෙනු ලැබේ.

V. තෝරා ගන්නා අයදුම්කරුවන් බදුල්ල දිස්ත්‍රික්කයෙහි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටී.

02. තෝරා ගන්නා අයදුම්කරුවන් සඳහා සියළු දීමනා සහිතව රු.32,270.00 ක මාසික දීමනාවක් කාර්යාංශය විසින් ගෙවනු ලැබේ.

03. මෙම නියමු ව්‍යාපෘතිය බදුල්ල දිස්ත්‍රික්කය තුල විදේශ රැකියාවන් හි නියුක්තව සියරට පැමිණෙන්නන් නැවත සමාජයට ඒකාබද්ධ කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන බැවින් ප්‍රජා සත්කාරක සේවා වැඩසටහන් හෝ ස්වේච්ඡා සේවාවන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් කෙරෙහි වැඩි ප්‍රමුඛත්වයක් ලබා දෙනු ලැබේ.

04. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් මේ සමග ඇති ආකෘතිය පරිදි සකස් කර ගත් තම අයදුම්පත් 2018.10.17 වන දින හෝ ඊට පෙර කළමනාකරු (පරිපාලන හා මානව සම්පත්) වෙත <u>mgr_adhr@slbfe.lk</u> යන විද්‍යුත් ලිපිනයට විද්‍යුත් තැපැල මඟින් යොමු කළ යුතු අතර, තම අයදුම්පත්‍රය ලැබුනු බවට පිළිතුරු පණිවුඩයක් කාර්යාංශය විසින් දින 03 ක් ඇතුලත ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කරනු ලැබේ. එම පිළිතුරු පණිවුඩය දින 03 ක් ඇතුලත නොලැබුන හොත් 011-2880500 දුරකථනය හරහා 334 දිගුව ඔස්සේ කළමනාකරු (පරිපාලන හා මානව සම්පත්) අමතා අයදුම්පත ලැබුනු බවට තහවුරු කර පිළිතුරු ඊ-මේල් පණිවුඩයක් ලබාගත යුතු බව අවධාරණය කරමි.

සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
කොස්වත්ත, බත්තරමුල්ල